## නැවත පදිංචි කරවීමේ අධිකාරිය 2010

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව නැවත පදිංචි කරවීමේ අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පවත්වා ඇත බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කරවීමේ අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය පවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති හා රෙගුලාස ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය හා 2003 ජුනි 02 දින හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 හා 6.5.3 වගන්ති | i. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.<br>ii. 2008 හා 2009 වර්ෂයන්හි වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. |
| (ආ) 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරියේ පනත | |
| i. I කොටසේ 12 වගන්තිය | උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවත්ව අවතැන්වූ ජනතාව නැවත එම ප්‍රදේශවල පදිංචි කරවීම හා අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා එම ප්‍රදේශවල ශාඛා කාර්යාල පිහිටුවීමට කටයුතු කළ යුතු වුවත් එම කාර්යය ඉටුකර නොතිබුණි. |

ii. III කොටසේ 20(1) වගන්තිය — අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු වුවත් එවැනි අරමදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.40,025 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,045 ක් වූයෙන් ප්‍රතිඵලයෙහි රු.51,070 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. අධිකාරියේ විවිධ ලැබීම් හා පරිපාලන වියදම් පිළිවෙලින් රු.මිලියන 3.9 කින් හා රු.මිලියන 3.6 කින් වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ II කොටසේ 13 වගන්තිය ප්‍රකාරව අධිකාරියෙහි පරමාර්ථ වන්නේ:

(i) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් ආරක්ෂිතව හා ගෞරවනීය ආකාරයෙන් නැවත පදිංචි කිරීම හෝ අළුතින් පදිංචි කරවීම තහවුරු කිරීම, සහ

(ii) රට අභ්‍යන්තරයේ අවතැන් වූ තැනැත්තන් සහ සරණාගතයන් සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීමට පහසුකම් සැලැස්වීම මගින් ඔවුන් පුනරුත්ථාපනය කිරීමට සහ ඔවුන්ට සහාය ලබා දීම පිණිස එකී තැනැත්තන් නැවත පදිංචි කිරීම සහ අළුතින් පදිංචි කිරීම පහසු කරලීම වේ.

කෙසේ වෙතත්, අධිකාරිය ආරම්භයේ සිට ඉහත පරමාර්ථ සාර්ථකව සම්පූර්ණ කර ගැනීමට සමත් වී නොතිබුණි. එසේම පනතේ II කොටසේ 14 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා (අ) සිට (ට) දක්වා ඉටු කල යුතු කාර්යයන් 15 ක් සඳහන්ව ඇතත් අධිකාරිය විසින් මේ දක්වා එම කිසිදු කාර්යයක් සාර්ථකව සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 09 දෙනෙකුගෙන් සමන්විත වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා 2010 සැප්තැම්බර් 15 දින පමණක් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමක් පවත්වා තිබුණි. කෙසේ වෙතත් 2008 වර්ෂයේ සිටම වර්ෂයකට අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් එක බැගින් පවත්වා තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඑඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ පරිච්ඡේද 4 අනුව අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පවත්වා මාසිකව කාර්ය සාධන පිළිබඳ ඇගයීමක් සහ එහි කටයුතු යාවත්කාලීන කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය ආරම්භයේ සිටම වාර්ෂික අයවැය මගින් පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, අධිකාරිය විසින ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා අමාත්‍යාංශයෙන් මුදල් ප්‍රතිපාදන ඉල්ලුම් කර නොතිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 25 ක් වූ අතර ඉන් 20ක් බඳවාගෙන වැඩ බෙදීමක් සිදුකර තිබුණත් කාර්ය සාධනය ඇගයීමක් සිදුකර නොතිබුණි. ආයතනය ආරම්භයේ සිටම පුරප්පාඩු වූ නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.

2.2.2 <u>සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් 2009 වර්ෂයේදී සකස් කර තිබූ නමුත් 2003 ජුනි 02 දිනැති අංක පීඑඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 පරිච්ඡේදයේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබුණි. මෙම චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද හා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කල සංයුක්ත සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම ආයතනය විසින් සකස් කර ඇති සංයුක්ත සැලැස්මේ පහත කරුණු ඇතුලත් කර නොතිබුණි.

(i) පසුගිය වර්ෂ 02 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සිදුකර නොතිබුණි.

(ii) ආයතනය සතු ශක්තීන්, දුර්වලතා, බාහිර බලපෑම් හා අවස්ථා ප්‍රමාණවත් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ නමුත් අරමුණු හා ඉලක්ක ඇතුලත් කර එය ආයතනයේ ක්‍රියාත්මක කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

### 2.2.3 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7 පරිච්ඡේදයේ 7.4.1 හා 7.4.2 වගන්ති ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.

### 2.2.4 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ කාර්යභාරයන් ශක්තිමත් කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණනයන් ඉටුකර නොතිබුණි.

### 2.2.5 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර 1% සිට 135% ක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 03. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණයවු පද්ධති හා පාලන දුර්වලතා අනාවරණය වු පද්ධති හා පාලන අඩුපාඩු සම්බන්ධයෙන් සංවිධානයේ සභාපතිවරයාගේ අවධානයට විටින් විට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරේ කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) කාර්යය සාධනය හා ඇගයීම

(ආ) අයවැය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) සේවක කළමනාකරණය